කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෘතීය පරීක්ෂණය (බාහිර) - 2011/2012

2014 අප්‍රේල්/මැයි/ජූනි

මානව ශාස්ත්‍ර පීඨය

නාට්‍ය හා රංග කලාව - DMAT E3025

නාට්‍ය නිර්මාණය හා විචාරය

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 09 යි. කාලය : පැය 03 යි.

---

1. ලෝ ප්‍රකට නාට්‍ය රචකයන් විසින් කතා වස්තු ගෙතීමේ දී අනුගමනය කර ඇති මූලධර්ම පිළිබඳ විමසීමක් කරන්න.

2. "රූපණය" යන්න නිර්වචනය කොට, භූමිකා නිරූපණයේ දී නළු නිළියන් විසින් අනුගමනය කරන රූපණ විධික්‍රම පිළිබඳ විග්‍රහයක් කරන්න.

3. රංග වින්‍යාසය යනු කුමක්දැයි පැහැදිලි කොට නාට්‍ය නිර්මාණයක සාර්ථකත්වයට එමගින් සිදුවන මෙහෙය කවරාකාර දැයි විමර්ශනය කරන්න.

4. රංග වස්ත්‍ර හා නාට්‍යෝපකරණ සැලසුම් කිරීමේ දී අවධානයට ගත යුතු කරුණු මොනවා දැයි පැහැදිලි කරන්න.

5. ඔබ නරඹා ඇති නාට්‍ය නිදසුන් කොට ගනිමින් සංගීත අධ්‍යක්ෂවරයාගේ කාර්යභාරය පිළිබඳ විමසීමක් කරන්න.

6. "රංගාලෝකය මගින් සිදු කෙරෙන්නේ වේදිකා දර්ශනය පෙනෙන්නට සැලැස්වීම පමණක් නොවේ." රංගාලෝකයේ අවශ්‍යතාව හා එමගින් ඉටුකරගත හැකි ප්‍රතිඵල සැලකිල්ලට ගනිමින් සාකච්ඡා කරන්න.

7. **එක්කෝ**

   (අ). නාට්‍ය අධ්‍යක්ෂවරයාගේ කාර්යභාරය පහත දැක්වෙන මාතෘකා යටතේ විමසා බලන්න.

   01. කලාකරුවෙකු ලෙස
   02. අර්ථකථනය කරන්නෙකු ලෙස
   03. කළමනාකරුවෙකු ලෙස

නැතිනම්

(ආ). ඔබ නාට්‍යයක් නිෂ්පාදනය කිරීමට සූදානම් වන්නේ නම් අධ්‍යක්ෂවරයෙකු වශයෙන් අනුගමනය කරන ක්‍රියාමාර්ග පැහැදිලි කරන්න.

8. ප්‍රේක්ෂක තෘප්තිය කෙරෙහි බලපාන සෞන්දර්යාත්මක නොවන ආකල්ප පිළිබඳ විග්‍රහයක් කරන්න.

9. නාට්‍ය විචාරයක අන්තර්ගත විය යුතු සංඝටක මොනවා දැයි පෙන්වා දෙමින් විචාරය අවශ්‍ය වන්නේ ඇයි ද යන්න හේතු සහිත ව පැහැදිලි කරන්න.

**************************